සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

9 ශ්‍රේණිය | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **1 - 20 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**
- **අංක 01 හා 02 ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. තාලුජ අක්ෂර පමණක් අන්තර්ගත පිළිතුර තෝරන්න.
(i) ක ඛ ග ඝ ඞ (ii) ට ඨ ඩ ඪ ණ (iii) ච ඡ ජ ඣ ඤ (iv) ත ථ ද ධ න

02. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
(i) කොට්ඨාශය (ii) ලේඛන (iii) සමස්ථ (iv) දෘෂ්ඨිය

- **අංක 03 සිට 06 දක්වා ප්‍රශ්නවල ඉරි ඇඳි පද කුමන වියරණ වර්ගයට අයත්වේදැයි තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

03. ''වැසි <u>වැස්සොත්</u> ගඟ පිටාර ගලයි.''
(i) මිශ්‍ර ක්‍රියා (ii) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
(iii) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා (iv) පූර්ව ක්‍රියා

04. ''ඔහු සේවකයා ලවා වැඩ <u>කරවයි.</u>''
(i) ප්‍රයෝජ්‍ය ක්‍රියා (ii) මිශ්‍ර ක්‍රියා (iii) පූර්ව ක්‍රියා (iv) විධි ක්‍රියා

05. <u>ඕ තොමෝ</u> සතුටින් ක්‍රියා කළා ය.
(i) ස්ත්‍රී ලිංග බහුවචන පදයකි. (ii) පුරුෂලිංග ඒකවචන පදයකි.
(iii) ස්ත්‍රී ලිංග ඒකවචන පදයකි. (iv) පුරුෂලිංග බහුවචන පදයකි.

06. මව්වරු දරුවන් <u>උදෙසා</u> කැපවෙති.
(i) යුගල පදයකි. (ii) තනි පදයකි. (iii) උපසර්ග පදයකි. (iv) නිපාත පදයකි.

07. පහත උක්ත පදවලට ගැළපෙන අනුක්ත පදය තිත් ඉර මත ලියන්න.
(i) කාන්තාවෝ : ..... (ii) මිනිස්සු : .....

08. ගෞරවය නැතිව යාම යන අදහස පළ කරන රූඪි පදය තෝරා යටින් ඉරක් අඳින්න.
(i) බහින කලාව (ii) කොරේ පිටට මරේ
(iii) සායම යනවා (iv) ඇඟේ ලේ වතුර වුණා

09. කවා - පොවා යන යුගල පදයේ අර්ථය පැහැදිලි වන සේ වාක්‍යයක් නිර්මාණය කරන්න.
.....

10. පහත දැක්වෙන වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.
(i) තරු පෙළ අහසෙහි බබළති.
.....
(ii) මැණියෝ දරුවන් රැකබලා ගත්තා ය.
.....

Past Papers Wiki

11. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා නැවත ලියන්න.

(i) ගොවියෝ කුඹුරු කොටති.

.....

(ii) ගුරුවරු ශිෂ්‍යයන් හික්මවති.

.....

12. පහත පදවලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(i) ගලින් නිමවන ලද : .....

(ii) අනුන් විසින් පෝෂණය කළ : .....

13. පහත සඳහන් පදවලට බහු අර්ථ පද දෙක බැගින් ලියන්න.

(i) දද : ....

(ii) පිය : ....

14. පහත දැක්වෙන නාමපද බහුවචනයට හරවන්න.

(i) මව : .....

(ii) ඔහු : .....

15. පහත සඳහන් නම් අකාරාදී පිළිවෙළට සකස් කර නැවත ලියන්න.

කුරුණෑගල, රාගම, කෑගල්ල, ගල්කිස්ස, කොළඹ

.....

16. නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද දෙවර්ගයම යොදා අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කර ලියන්න.

(i) .....

(ii) .....

17. පහත සඳහන් පාඨවල වචන නිවැරදි ව වෙන් කර නැවත ලියන්න.

(i) ඔබටයහපතක්මවේවා!

.....

(ii) ඔහු බලියා ගත් පහ තරට බෙර වාද නයත් උගත් තේය.

.....

18. සතර අභිනයන් අතුරින් අභිනයන් දෙකක් නම් කරන්න.

(i) ..... (ii) .....

- **අංක 19 හා 20 ප්‍රශ්නවල කවිවල ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.**

19. ගස වතු සුදු

වී පිරිසිදු

.....

.....

20. ලප සේ සඳ විලසේ දවසක් වෙන්නුවෙ මිමා

එප සේ බුදු කෙනෙකුන් මෙන් රැකිදැයි නිතියෙ මිමා

.....

.....

(ලකුණු 2 x 20 = 40)

II - කොටස

- **1, 2 හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ඇස් වල දුම් හැපේ
අත් වල පොතු කැපේ
කඹුරාගේ ළිපේ
වළං කැකුළු පිපේ

(අ) මෙම පද්‍ය රචනා කළ රචකයාගේ නම ලියන්න.

(ආ) මෙම පද්‍යයෙන් පැවසෙන්නේ කුමන කර්මාන්තයක් පිළිබඳව ද?

(ii) පහත සඳහන් මානව ශාස්ත්‍ර ග්‍රන්ථ අයත්වන ආගම් මොනවා ද?

(අ) තිරක්කුරල් :- .....

(ආ) ශුද්ධ වූ කුරානය :- .....

(iii) "මේ ඉන්නේ නිකම් ම නිකම් හිස් මනුෂ්‍යයෙක් නොවේ සර්! මතු බුදු වෙන්ට පෙරුම් පුරන බෝධිසත්ත්ව උත්තමයෙක්"

(අ) මෙම උද්ධෘතය ඇතුළත් කතාවේ නම කුමක් ද?

(ආ) එම කතාවේ රචකයා නම් කරන්න.

(iv) පහත සඳහන් කෘති රචනා කළ රචකයන් නම් කරන්න.

(අ) මධ්‍යකාලීන සිංහල කලා :-

(ආ) ළඳරු ගී :-

(v) කෙටිකතා රචනයේ දී ප්‍රබල ලෙස යොදා ගන්නා දෘෂ්ටිකෝණ දෙකකි. එනම්,

(අ) ..... දෘෂ්ටිකෝණය හා

(ආ) ..... දෘෂ්ටිකෝණය ය.

(ලකුණු 2 × 5 = 10)

02. පහත සඳහන් මඟ පෙන්වන ලද ඡේද අතරින් එකක් තෝරා ගෙන වචන 200 කට නො අඩු වන සේ රචනයක් ලියන්න.

(i) ජනයා අතර කාලාන්තරයක් තිස්සේ කටින් කට පැවත එන කතන්දර ඇත. ඒවා ජනකතා ලෙස හැඳින්වේ. බොහෝ ජනකතා ළමයාට උචිත අන්තර්ගතයකින් සමන්විත වන අතර ජීවිතයට ආදර්ශයන් ද සපය යි. අතීත ජන සමාජය පදනම් කොට ගෙන ලියා ඇති ජනකතා ළමයින්ගේ දැනුම පුළුල් කිරීමට ද ඉවහල් වේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන "ජනකතා ළමා සාහිත්‍යයේ වැදගත් අංගයකි." යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ii) තාක්ෂණය මිනිසාට අත්‍යවශ්‍ය අංගයක් වී ඇත. දූරකථනය, පරිගණකය හා අන්තර්ජාලය වැනි මෙවලම් මේ අතර ප්‍රධාන තැනක් ගනී. ඉගෙනීම, සන්නිවේදනය සහ විනෝදාස්වාදය වැනි ක්ෂේත්‍රවල දී මේවාගෙන් ලැබෙන දායකත්වය අතිමහත් ය. නිසි පාලනයකින් තොරව මේවාට ඇබ්බැහිවීම නිසා අත්වන අයහපත් ප්‍රතිඵල ද අපට අසන්නට දක්නට ලැබේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන "මිනිසාගේ දියුණුවට තාක්ෂණය" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(iii) කසළ නිසි ලෙස බැහැර නොකිරීම නිසා පරිසර දූෂණය, ජල මාර්ග අවහිරවීම, මැසි මදුරු ව්‍යාප්තිය වැනි බහුතර ගැටලු ඇති වී ඇත. කසළ වර්ගීකරණය හා ප්‍රතිචක්‍රීකරණයට ලක් කළ හැකි ද්‍රව්‍ය වෙන් කිරීම වැනි ක්‍රම අනුගමනය කරමින් කසළ කළමනාකරණය කිරීම මඟින් එම ගැටලු මඟහරවා ගැනීමට සහාය දැක්වීම අපගේ වගකීමකි. මෙම කරුණු සැලකිල්ලට ගෙන "කැලිකසළ නිසි ලෙස බැහැර කරමු" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(iv) චාමරත් මමත් එදා උදෑසනින් ම ඔරුවට නැග්ගේ ඈත පෙනෙන දූපතට ගොස් එහි සිටින සතුන් හා ගස්වැල් පිළිබඳ තොරතුරු සෙවීමේ අපේක්ෂාවෙනි. එදා නිවාඩු දිනයක් නිසා ම බොහෝ සංචාරකයන් දූපතට යාමේ අපේක්ෂාවෙන් තොටුපලේ රැඳී සිටියහ. සංචාරකයින් රැගත් ඔරු කිහිපයක් අප සමීපයෙන් ද ගමන් කළේය..... මෙතැන් සිට කතාව ලියන්න. මාතෘකාවක් ද යොදන්න.

(ලකුණු 20)

03. ඔබේ පෙළ පොතේ ඇතුළත් පහත උද්ධෘත ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) විල් ජලයේ ගොහොරු මඩේ
සුදු රතු <u>සියපත්</u> පිපේ
අවලස්සන කොවුලු තුඩේ
පන්සිළු <u>වෙණු</u> නද නැගේ

(අ) ඉරි ඇඳි පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.

(ආ) මෙම ගීතයේ පද රචකයා නම් කරන්න.

(ii) ''මේ ආරංචිය ඇහුවම මම කොච්චර කලබල වුණා ද කිව්වොත් සොඳුර කියපු දේත් තෙරුණේ නෑ''
(අ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කව්රුන් විසින් ද කාහට ද?
(ආ) මෙහි සඳහන් ආරංචිය කුමක් ද?

(iii) ''අතීතයේ දී උණ බටවලින් සැකසූ පන්දම් එළියෙන් හෝ ලන්තෑරුම් එළියෙන් ගමන් කළ සරල පෙරහැරක් වූ මෙය වර්තමානය වන විට විචිත්‍රවත් පෙරහැරක් බවට පත්ව ඇත.''
(අ) මෙයින් ප්‍රකාශ වන පෙරහැරේ නම කුමක් ද?
(ආ) මෙහි සඳහන් පෙරහැර වර්තමානයේ විචිත්‍රවත් කිරීමට යොදා ගෙන ඇති විවිධ අංග අතුරින් දෙකක් ලියන්න.

(iv) විජේසිංහ අමතක ද උඹට
කම්හලේ රෝදයට
අත බිඳී ගිය දවස
නාදන් නොවේ ද නුඹ
බේර ගත්තේ එදින
පිච්චමල් හදවතින්
ලේ දෙමින්
වාට්ටුව ළඟ ඉඳින්
මලමුත්‍ර ගෙන යමින්
(අ) මෙම නිර්මාණයෙන් සමාජයට දෙන ශ්‍රේෂ්ඨ පණිවිඩය කුමක් ද?
(ආ) මෙම කවියේ සඳහන් රූපකාර්ථවත් යෙදුම කුමක් ද?

(v) ''මේ ජනයාගේ පළමු ජනාවාසය සකස් වූයේ කොම්පඤ්ඤ වීදිය ආශ්‍රිතව ය. පසු කලෙක ඔවුහු විවිධ වෘත්තීන්ට බෙදී ගොස් විවිධ පළාත්වල පදිංචි වූහ.''
(අ) මෙහි සඳහන් ජනවර්ගය නම් කරන්න.
(ආ) වර්තමානයේ ඔවුන් බහුලව ජීවත් වන ගම්මානය හැඳින්වෙන නම කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

04. ඔබ පාසලේ ශිෂ්‍ය නායක පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අවශ්‍ය බව ශිෂ්‍ය නායක කමිටුව විසින් යෝජනා කර ඇත. 2025.12.30 දින පෙ.ව. 8.30 සිට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී වැඩසටහන පැවැත්වීමට තීරණය විය. මෙම වැඩසටහනේ ප්‍රධාන දේශනය පැවැත්වීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට / තුමියට ආරාධනා කිරීම ද තීරණය කර ගන්නා ලදී.
ශිෂ්‍ය නායක කමිටුවේ ලේකම් ඔබ යැයි සිතා මේ සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න.

(ලකුණු 10)

05. පහත සඳහන් ඡේදය වචන 35 - 40 අතර වන සේ සාරාංශ කර ලියන්න.

රජරට පුරා ගොඩ නංවා ඇති වැව් ඉස්මත්තේ දිස්වෙන්නේ පාරිශුද්ධත්වයේ සංකේතය වූ දාගැබ් වහන්සේ ය. නිල්වන් දියෙන් පිරුණු වැව පවසන්නේ තමා කෙත් යායවල් පෝෂණය කිරීමට සැදී පැහැදී සිටින බවකි. ඊට ආශිර්වාදය බුදු දහමින් ලැබෙන බව දාගැබ් වහන්සේගෙන් තහවුරු වේ. මේ අනුව 'දාගැබ', 'වැව' හා 'කෙත් යාය' යන උදාරතර වස්තු අපේ සංස්කෘතියේ හැඩරුව පවසයි. වී ගොවිතැන් සිදු කෙරෙන යාය පණ ලබන්නේ ජල සම්පතිනි. ඒ ජල සම්පත් ගබඩා කර වී ගොවිතැන සඳහා ජීවය ලබා දීම පිණිස වාරි සංස්කෘතියක් ගොඩ නැංවිණි. වී ගොවිතැන ඇති නොවන්නට වාපි හා වාරි තාක්ෂණය ද මෙම සංස්කෘතිය ද ගොඩ නොනැංවනු ඇත. ලෝකයේ ඉහළ ම සංස්කෘතියක් අපට හිමි වූයේ ජලය වී ගොවිතැන හා අත්‍යන්ත ව ප්‍රතිබද්ධ වූ නිසා ය.

(ලකුණු 1 × 10 = 10)

06. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තිරසර සංවර්ධන ඉලක්ක ජය ගනිමින් 2030 වන විට ගෝලීය පුරවැසියෙකු බිහි කිරීම සඳහා අධ්‍යාපනයට පැවරෙන්නේ සුවිශාල කාර්යභාරයකි. විෂය දැනුමෙන් පමණක් නොව මිනිසෙකු ලෙස සමාජයේ ජීවත් වීමට අවශ්‍ය හරපද්ධති, සාරධර්ම, දයාව, කරුණාව, නිර්මාණශීලී බව ආදී මානව ගුණාංගවලින් ද පිරිපුන් සමබර පෞරුෂයකින් යුක්ත වූ මිනිසෙකු නිර්මාණය කිරීමේ අභියෝගය ද ඊට අයත් ය. අධ්‍යාපනය තුළ පවතින කුසලතාවක් වන 'කියවීම හුරු කිරීම' ඉහත අභියෝගයට සාර්ථකව මුහුණ දීම සඳහා භාවිත කළ හැකි සාර්ථක ම මෙවලමයි.

දියුණු රටවල කැපී පෙණෙන ලක්ෂණයක් වන්නේ පොතපත කියවන ප්‍රබුද්ධ ජනතාවක් සිටීමයි. එම රටවල පාසල් ගුරුවරුන් විෂය කරුණු උගන්වනු වෙනුවට සිදු කරන්නේ පොතපත ඇසුරින් කරුණු සෙවීමට සිසුන් පෙළඹවීමයි. එහි ප්‍රතිඵලය වන්නේ ඉගෙනීමට උගත්, ස්වයං අධ්‍යාපනයෙහි නිපුණ, නව දැනුම නිතර සොයා යන පරපුරක් බිහි වීමයි. එමගින් යාවජීව අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමට සංවර්ධනය වූ රටවලට හැකියාව ලැබී ඇති අතර ම පොතපත නිතර කියවීමට හුරු ජනතාවක් රටක ප්‍රගමනයට මනා පිටිවහලක් වන්නේ ය.

(1) අධ්‍යාපනයට පැවරෙන සුවිශාල කාර්යභාරය කුමක් ද?
(2) සමබර පෞරුෂයකින් යුත් මිනිසකු නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපනයේ ඇති සාර්ථක මෙවලම නම් කරන්න.
(3) ඡේදයේ සඳහන් මානව ගුණාංග දෙකක් ලියන්න.
(4) පොතපත ඇසුරින් කරුණු සෙවීමට පෙළඹවීමෙන් ලැබෙන ප්‍රතිඵලය සඳහන් කරන්න.
(5) පහත සඳහන් වචනවල අරුත් පැහැදිලි කරන්න.
- යාවජීව :-
- ප්‍රගමනය :-

(ලකුණු 1 × 10 = 10)

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) ii (03) iii (04) i (05) iii (06) iv (07) (i) කාන්තාවක (ii) මිනිසුන්

(08) iii (09) මව දරුවන් කවා පොවා ඇති දැඩි කළා ය.

(10) (i) තරු පෙළ අහසෙහි බබළයි. (ii) මැණියෝ දරුවන් රැකබලා ගත්තෝ ය.

(11) (i) ගොවියන් විසින් කුඹුරු කොටනු ලබයි / ලැබෙයි.
(ii) ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ හික්මවනු ලබති.

(12) (i) ශෛලමය (ii) පරපුටු (13) (i) කොඩිය, කුෂ්ඨය (ii) තාත්තා, පියවර, ප්‍රිය

(14) (i) මව්වරු (ii) ඔවුහු (15) කැඟල්ල, කුරුණෑගල, කොළඹ, ගල්කිස්ස, රාගම

(16) (i) සුදු නංගී වේගයෙන් ගමන් කරයි. (ii) දෑසේ නිල් පැහැය සෙමෙන් තුරන් විය.

(17) (i) ඔබට යහපතක් ම වේවා (ii) ඔහු බලි යාගත් පහතරට බෙර වාදනයත් උගත්තේ ය.

(18) වාචික අභිනය / සාත්වික අභිනය / ආංගික අභිනය / ආහාර්ය අභිනය /

(19) පොහොය නැතිදු - සිල්ගත් බඳු

(20) සැපසේ අප දන් දුන්නෙත් වැදුවෙන්වද අම්මා - අප සේ පිය රජුනි දනට නො දෙන්න අපෙ අම්මා

(ලකුණු 2 x 20 = 40)

II කොටස

01. (i) (අ) පරාක්‍රම කොඩිතුවක්කු
(ආ) වළං කර්මාන්තය / කුඹල් කර්මාන්තය / වළං සෑදීම

(ii) (අ) හින්දු
(ආ) ඉස්ලාම්

(iii) (අ) දිට්ඨදාන (ආ) ජේ.ඩී.පී. එස්. සිරිවර්ධන මයා

(iv) (අ) ආනන්ද කුමාරස්වාමි (ආ) ආනන්ද රාජකරුණා

(v) (අ) ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණය (ආ) උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය (පිළිතුර මාරුවිය හැකිය)

02. රචනය සඳහා ලකුණු 20 යි.

සාරවත්භාවය	06
සංවිධානය, නිර්මාශීලීත්වය හා ස්වීයත්වය	10
ශිල්පීය දක්ෂතා (අක්ෂර වින්‍යාස, පද බෙදීම, උක්ත ආඛ්‍යාත සම්බන්ධය ආදී)	04

03. (i) (අ) • සියපත් : නෙලුම් / තඹර / පංකජ / පියුම් / පද්ම • වෙණ : වීණාව
(ආ) ඩබ්ලිව්.ඒ. අබේසිංහ මයා

(ii) (අ) රජතුමා රජබිසවට
(ආ) මනාසාර පලඳනාව සොකරම් කිරීම / නැතිවීම

(iii) (අ) කයීන පෙරහැර
(ආ) කසකරුවන් / ගිනිබෝල කරුවන් / නර්තන ශිල්පීන් / බෙර වාදකයන් / මල් බයිසිකල්කරුවන් / හස්තීන් (පාඩමේ සඳහන් වන්නේ මෙම අංග පමණක් වුවද ගැළපෙන පිළිතුරකට ලකුණු ලබා දෙන්න.)

(iv) (අ) ජාති ආගම් බේදයකින් නොව සැමට උපකාර කළ යුතු බව. (ආ) පිච්චමල් හදවතින්

(v) (අ) කැෆර්වරු / සිලෝන් කැෆර්වරු (අ) සිරම්බි අඩිය

04. ආරාධනා පත්‍රය ලකුණු 10.

ආකෘතිය 04

කෙටි මාතෘකාව	01
ආරාධනා කරන්නේ කවු ද?	01
පළ කරන දිනය	01
නිර්මාණශීලීභාවය	01

අන්තර්ගතය 06

වැඩසටහනේ නම	01
ස්ථානය	01
දිනය	01
වේලාව	01
අරමුණ	01
අධ්‍යක්ෂතුමාට ආරාධනා කිරීම	01

PAST PAPERS WIKI

05. සාරාංශය

අන්තර්ගතය - ලකුණු 06
වචන ගණන - ලකුණු 02 (වචන 35 - 40 අතර)
ශිල්පීය දක්ෂතා - ලකුණු 02 (අක්ෂර වින්‍යාස, උක්ත ආඛ්‍යාත නිවැරදි පද බෙදීම)

- වැව් ඉවුරේ ඉදි කළ දාගැබ පාරිශුද්ධත්වයේ සංකේතයයි.
- වැවෙන් කෙත පෝෂණය වන බව.
- වී ගොවිතැන ගොඩ නැංවීම සඳහා වැව් හා වාරි සංස්කෘතියක් ගොඩ නඟන ලදී.
- මේ නිසා අපට ලෝකයේ ඉහළ ම සංස්කෘතිය හිමිව ඇත.

06. (i) තිරසර සංවර්ධන ඉලක්ක ජය ගනිමින් 2030 වන විට ගෝලීය පුරවැසියෙකු බිහි කිරීම.
(ii) කියවීමට හුරු කිරීම
(iii) කරුණාව / දයාව / සාරධර්ම / නිර්මාණශීලී බව
(iv) ඉගෙනීමට උගත් / ස්වයං අධ්‍යාපනයෙහි නිපුණ / නව දැනුම නිතර සොයා යන පරපුරක් බිහිවීම
(v) යාවජීව - දිවි ඇති තාක් / ජීවිතය තිබෙන තුරු
ප්‍රගමනය - යහපත් ගමන / දියුණුව

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank